**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - 2023**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ (“ආයතනය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනත, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරික්ෂා කිරිමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිපුණතා සවිය ශිෂ්‍යාධාර ලබාදීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ලද රු.12,583,900ක මුදලින් උපයෝජනය නොකළ රු.461,700ක වටිනාකම වගකීමක් ලෙස හඳුනාගැනීම වෙනුවට ආදායමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ජංගම වගකීම අඩුවෙන් දක්වා තිබුණි. | නිපුණතා සවිය සඳහා ලද මුදල්වල ඉතිරියක් ලෙස රු.461,700.00ක වටිනාකම පෙන්වාදී ඇත්තේ මුදලින් කල ගෙවීම් සලකාය . | වගකීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති ණයගැති ශේෂය වූ රු. 2,126,701ක් සඳහා රු.1,025,169ක් අඩමාණ ණය වෙන්කිරීම් කර තිබුනද, එම වටිනාකම ගණනය කළ ආකාරය සහ ඊටඅදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | වර්ෂ පහකට වඩා පැරණි ණයගැතියන් අඩමාණ ණය වශයෙන් සැලකීම ආයතනයේ අඩමාණ ණය සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය වේ .එය මූල්‍ය ප්‍රකාශන සටහන් යටතේ ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. . | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් තිදෙනෙකු වෙත ගෙවන ලද එකතුව රු.7,310,975ක පාරිතෝෂික වියදම් නිසි ලෙස ගිණුම්ගත කර තිබුනද එම මුදල, වර්ෂ අවසානයේ පාරිතෝෂික වෙන්කිරීම් ලෙසද ගිණුම්ගත කර තිබුණි. එසේම නිලධාරීන් 07 දෙනෙකු වෙනුවෙන් සැලසිය යුතු රු 2,728,263ක, ප්‍රතිපාදන සලසා නොතිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පාරිතෝෂික වියදම හා පාරිතෝෂික වෙන් කිරිමේ ශේෂය රු . 4,582,712 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරීන් තිදෙනෙකු වෙත ගෙවන ලද එකතුව රු.7,310,975 වටිනාකම උපලේඛනයේ ඔවුන් විශ්‍රාම ගිය දින දක්වා ඔවුනට අදාල වන පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම වේ .<br>සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරීන් 7 දෙනෙකු වෙනුවෙන් වෙන් කල යුතු ලෙස දක්වා තිබෙන රු.2,728,263 යන වටිනාකම අතපසු වීමක් හේතුවෙන් 2023අවසන් ගිණුම් තුල සඳහන් වන ශේෂයෙහි අන්තර්ගත නොවේ . | පාරිතෝෂික වෙන් කිරීම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව |
| (ඈ) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2023 වර්ෂයේදී පුහුණු උපකරණ ලෙස ලබාදී තිබුණු මෝටර් රථ දෙකක වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂාකර බලා ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ . | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව |
| (ඉ) ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන යටතේ (SSDP) ක්‍රියාත්මක කරන ලද කාන්තා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියෙන් ලැබී තිබූ සුහුරු පන්ති කාමර උපකරණවල වටිනාකම වූ රු.6,332,423 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂාකර බලා ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ . | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුරෙ. 396 | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 5,757,024.ඉක්මවූ රුක වටිනා චෙක්පත් 07ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල චෙක්පත් ගෙවීම් විස්තර පරීක්ෂා කර වහාම අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි වලට අනුගත විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XV පරිච්ඡේදයේ වගන්තිය 4.10 | අනිවාර්ය සේවා කාල පරිච්ඡේදයකට යටත් නිලධාරියෙකු නැවත දේශීය අධ්‍යයන නිවාඩු ලබාගැනීමේදී පළමු අනිවාර්ය සේවා කාලයේ | අතපසුවීමකින් කාල පරිච්ඡේදය වැරදියට සටහන් වී ඇත.එය නිවැරැදි කිරීමට කටයුතු කරන අතර ඉදිරියේදී ගිවිසුම්ගත වීම නිවැරැදිව සිදු කිරීමට කටයුතු කරනු ඇත. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ශේෂ වූ කාලයද එකතු කර ගිවිසුමට එළඹිය යුතු වුවද , එසේ නොමැතිව නිලධාරියෙකුට අනිවාර්ය සේවා කාලපරිච්ඡේදය වූ මාස අත්හැර 66 දේශීය අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. | | |
| (ඇ) | 2022 අගෝස්තු 22 පාර වයාදිනැති රාජ්‍ය ලේඛ අංකවක්‍ර PED 2022/05හි 3.2 ඡේදය | ශ්‍රී ලංකාවෙන් බැහැරගත කිරීම සඳහා නිවාඩු ඉල්ලුම් කරන නිලධාරීන් දෙදෙනෙකු විසින් විදේශයේදී නිරතවීමට අපේක්ෂා කරන රැකියාව සහ ඊට අදාළ තොරතුරු නිවාඩු අනුමත කරන බලධාරියා වෙත ඉදිරිපත් කිරීමක් සිදු නොකර විදේශ ගතවී තිබුණි . | අධ්‍යාපන සම්පූර්ණ කර අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 ජූලි 18 දිනැති අංක 2018/03දරන කළමණාකරන සේවා චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතියක් ලබා නොගෙන ආයතනය විසින් පැමිණීමේ දීමනා, නිෂ්පාදන දිරිදීමනා, අතිරේක දීමනා, දිරි දීමනා, දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දීමනා වශයෙන් රු.17,558,037 ක් ගෙවා තිබුණි. තවද, නිෂ්පාදන දිරිදීමනා ගෙවීමේදී කාර්යසාධනය මැනීමේ ක්‍රමයක් තීරණය කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි | නිෂ්පාදන දිරි දීමනා සඳහා අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. ආයතනයේ රාජකාරි කටයුතු විධිමත්ව පවත්වා ගෙන අරමුණින් අනෙකුත් දීමනා ලබා දී ඇති අතර ඉදිරියේදී ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 5,008,330 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.6,448,032 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 11,456,362 කින් වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අර්ධ කාලීන පාඨමාලා ආදායම රු.මිලියන 51,628,266 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 අංක 15දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 16වන වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විමසා අදාල අමාත්‍යවරයා විසින් 06 දෙනෙකුගෙන් සමන්විත ආයතනයේ උපදේශන සභාවක් පත්කල යුතු අතර ,එම උපදේශන සභාව විසින් පනතේ 04 වන වගන්තියේ සඳහන් කර ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධ සියළු කාරණා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අදාල අමාත්‍යවරයාට නිර්දේශ ලබාදිය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වා එවැනි උපදේශක ආයතනයක් පත්කර නොතිබුණි. එබැවින් ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ප්‍රවීන උපදේශක ආයතනයක උපදෙස් මත ක්‍රියාත්මක කර නොතිබුණි | අදහස් දක්වා නැත. | පනතේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුයි. |
| (ආ)2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 4 වගන්තියේ (ඇ) (ඌ) හා (ඕ) යටතේ ආයතනයේ කර්තව්‍යයන් ලෙස වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ කරගෙන යාම, කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම හා වෘත්තිය සහ තාක්ෂණික පුහුණු කිරීම් පිළිබඳව සඟරා සහ වාර ප්‍රකාශන පළ කිරීම දක්වා තිබුණද, එම කර්තව්‍යයන් සමාලෝචිත වර්ෂය දක්වා ඉටුකර නොතිබුණි. | මේ සඳහා පර්යේෂණ, සංවර්ධන හා නව නිපැයුම් අංශයක් (Research & Development and Innovation) ස්ථාපිත කර ඇති අතර එම අංශයට අවශ්‍ය කාර්යය මණ්ඩල ඇස්තමේන්තුව අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ සඳහා මේ වන තෙක් නිර්දේශ/අනුමැති ලැබී නොමැත. මාසික සඟරා සහ වාර ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 05 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති අතර, එය ක්‍රියාත්මක වෙමින් පවතී. | පනතේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුයි. |
| (ඇ). ආයතනය භුක්ති විඳින එකතුව අක්කර 29 ක් හා හෙක්ටයාර 0.35 වූ ඉඩම් 05 ක් ලංකා ගමනාගමන මණ්ඩලයට හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු බව දැක්වුවද, ඒවායේ නීත්‍යානුකූල හිමිකාරීත්වය හඳුනාගෙන පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් වල අයිතිය විධිමත් පරිදි පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අමාත්‍යාංශ අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු) විසින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත 2024.01.24 දින ලිපියක් යොමු කර ඇත. | මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිකාරීත්වයක් හඳුනාගෙන පවරා ගැනීම් සිදුකළ යුතුය. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් අයිතම් 11කට අදාල රු.3,878,806ක් 2016 වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් තිබුණද අදාල ශේෂයන් සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි . | මෙම වටිනාකම ආයතනය විසින් MTTC අංශයේ වෙනම ගිණුම් පිළියෙල කරන විටදී, ලෙජරයේ ජංගම ගිණුමක් ලෙස පවත්වාගෙන යන ලද හර හා බැර ශේෂයන් 02න් හර ශේෂය දැක්වෙන ගිණුම වේ. එම | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් නිශ්චිතව හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට හෝ ගැලපීමට |

| | | |
|---|---|---|
| | නිසා මෙය පිලිබඳ පාලක මණ්ඩලයට ඉදිරිපත් කර, පාලක මණ්ඩල අනුමැතිය යටතේ ජංගම ගිණුම් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කරන බව ප්‍රකාශ කරමි. | කටයුතු කළ යුතුය. |
| (ඉ) ආයතනයේ සිසුන් බඳවා ගැනීමේ සංඛ්‍යාව 600 සීමාවේ පැවතුණද, වාර්ෂිකව වැඩිවන ඉල්ලුමට සාපේක්ෂව විධිමත් සැලසුමක් මගින් අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන පාඨමාලා සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, රත්මලාන පුහුණු මධ්‍යස්ථානයේ ඉඩකඩ හා ගොඩනැගිලි පහසුකම් සීමා වුවද ආණමඩුවේ පැවති අක්කර 09 ක හා කිලිනොච්චියේ පැවති අක්කර 25ක ඉඩම් වල පුහුණු මධ්‍යාස්ථාන පිහිටුවා පුහුණු කටයුතු එම ප්‍රදේශ වල ව්‍යාප්ත කිරීමට කළමණාකරනය මඟින් නිසි පියවර ගෙන නොතිබුණි. | වාර්ෂිකව බඳවා ගැනීම වැඩි කිරීම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය භූමි අත්පත් කර ගැනීම මේ වන විට ක්‍රියාත්මක වන අතර අවම ඉඩ පහසුකම් යටතේ වුවද බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව 600 සිට 650 දක්වා වැඩි කිරීමට 2024 වර්ෂයේදී පියවර ගෙන ඇත.<br><br>ආණමඩුවෙහි ඉදිරියේදී නව පාඨමාලා ආරම්භ කිරීම සඳහා මධ්‍යස්ථානාධිපති හට උපදෙස් ලබා දී ඇත.<br><br>කිලිනොච්චි ආයතනයේද නව NVQ 4 පාඨමාලා 5ක් ආරම්භ කිරීමට 2024/04/29 දින පැවති පාලක රැස්වීමේදී අනුමැතිය ලබා දුන් අතර ඒ තුළින් එහි ඉඩකඩ ද භාවිතය වැඩි කර ගනු ලැබේ. | ආයතනයේ ධාරිතාවය වැඩිකර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කළ යුතුය. |
| (ඊ) සිසුන් ලියාපදිංචි අවස්ථාවේ සිට පුහුණු කාලය අවසන් වූ පසු රැකියාගත කිරීම තෙක් (පසුවිපරම් කිරීම) තොරතුරු පවත්වා ගැනීම කලයුතු වුවද ආයතනය විසින් ඒ සඳහා නිවැරදි තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් ආයතනයේ සමස්ථ කාර්යසාධනය මැනීමට නොහැකි විය. | අදහස් දක්වා නැත. | සිසුන්ගේ පුහුණු අවශ්‍යතා ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සතු අධ්‍යක්ෂ/ විදුහල්පති නිල නිවස 2020 වර්ෂයේ මුල සිට කිසිදු නිලධාරියෙකුගේ භාවිතයට හෝ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින බව නිරීක්ෂණය වූ නමුත් මෙම නිල නිවසේ ආරක්ෂක ගාස්තු ලෙස 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.3,180,610 ක් නිෂ්කාර්ය ලෙස නිෂ්ඵල වියදම් කර තිබුණි. | ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටා ඇති විදුහල්පති නිළ නිවස තුල ඇති වටිනා වත්කම් ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ආයතනයේ හිටපු විදුහල්පතිවරු නිල නිවස භාවිතා නොකල අතර වර්තමානය වන විට එය අළුත්වැඩියා කල යුතු තත්ත්වයක පවතී. තවද එය අළුත්වැඩියා කර වත්මන් අධ්‍යක්ෂ විදුහල්පතිගේ භාවිතයට ගැනීමට නියමිතය. | නිෂ්කාර්ය වත්කම් කඩිනමින් ගිණුම්වලට ගලපා අදාළ පරිදි ඉදිරියට කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මානව සම්පත් සංවර්ධන හා පුහුණු ප්‍රතිපත්තිවලට පටහැනිව ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරීම සඳහා නිලධාරියෙකු විසින් නිවාඩු අනුමත නොකර පාඨමාලා සඳහා සහභාගී වී තිබුණි. එසේම පුහුණු/අධ්‍යන පාඨමාලා හැදෑරීම සඳහා ලබාදෙන වැටුප් සහිත නිවාඩු කාලය වසර 03ක උපරිමයකට යටත් වුවද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට වර්ෂ 05ක වැටුප් සහිත නිවාඩු අනුමත කර තිබුණි.තවද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විසින් වැටුප් සහිත දේශීය අධ්‍යයන නිවාඩු ලබා ගැනීමේදී ගිවිසුමකට හා බැඳුම්කරයකට එළඹිය යුතු වුවද, නිලධාරීන් තිදෙනෙකු සඳහා එළඹිය යුතු රු.5,293,317 ක් වටිනා බැඳුම්කර අත්සන් කර නොතිබුණි. | මේ වනවිට දේශීය අධ්‍යයන නිවාඩු ලබා සිටින නිලධාරීන්ගේ පැමිණීමේ සටහන් අදාල දින සිට මේ දක්වා පුහුණුව ලබන ආයතනයෙන් ලබා ගෙන ඇති අතර ඉදිරියේදී නියමිත දිනට පැමිණීමේ සටහන් ගෙන්වා ගැනීමෙන් අනතුරුව වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | මානව සම්පත් සංවර්ධන හා පුහුණු ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) ආයතනයේ විදුහල්පති තනතුර 2024 මැයි 04 දින සිට කොන්ත්‍රාත් පදනම මත පවත්වාගෙන ගොස් තිබූ නමුත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමකින් තොරව නිලධාරියා සේවයේ තබාගෙන ගෙවීම් සිදුකර තිබුණි. | ස්ථිර විදුහල්පති වරයෙකු බඳවා ගන්නා තෙක් කැබිනට් අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත එම නිලධාරී මහතා විදුහල්පති තනතුරෙහි සේවයේ යොදාගෙන ඇත. | කොන්ත්‍රාත් පදනම අවසන් වී ඇති බැවින් එය දීර්ඝ කිරීමට හෝ අදාළ පරිදි කටයුතු කිරීමට කටයුතු කළ යුතුය. |